ශ්‍රී ලංකාවේ

# බන්ධනාගාර තත්වයන්

ආරක්ෂාව, රැකවරණය, පුනරුත්ථාපනය යන යන මූලික අරමුණු ඉටුකර ගැනීම උදෙසා කැපවී සිටින ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුව වර්ථමානයේ දිනෙන් දින මුහුණ දීමට සිදුව ඇති අධික තදබදය හේතුවෙන් බරපතල අර්බුධයකට මුහුණ දී ඇති මෙයට හේතු වී ඇත්තේ දැනට බන්ධනාගාර වල සිටින රැඳවියන්ගේ ගණන බන්ධනාගාර අනුමත ධාරිතාවය අභිබවායාමයි.

වර්ථමානයේ මේ තදබදය 300% කට ආසන්න මට්ටමකින් ඉහළ ගොස් ඇති අතර මේ හේතුවෙන් රැඳවියන් සේම නිළධාරීන්ද දැඩි අපහසුතාවයන්ට මුහුණ දී ඇත. සීමිත ඉඩකඩ, ප්‍රමාණවත් නොවන සනීපාරක්ෂිත පහසුකම් සහ වෛද්‍ය ප්‍රතිකාර නිසි පරිදි නොලැබීම වැනි මූලික අවශ්‍යතාවයන් අහිමි වීම මෙහි ප්‍රධානතම ප්‍රථිඵලයක් ලෙස රැඳවියන්ට මුහුණ දීමට සිදුව ඇත. මෙහි තවත් ප්‍රතිඵලයක් ලෙස බන්ධනාගාර කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව සහ මානසික සෞඛ්‍යයටද විශාල බළපෑමක් එල්ල වී ඇති මීට අමතරව, නඩු විභාගයන් ප්‍රමාද වීම, පුනරුත්ථාපන වැඩසටහන් සඳහා අවස්ථා අඩුවීම, ඇති සම්පත් ප්‍රමාණවත් නොවීම සහ රාජ්‍ය වියදම් මත අමතර බරක් එකතු වීම නිසා බන්ධනාගාර පද්ධතියේ අරමුණු වන ප්‍රතිසංස්කරණය සහ සමාජ නැවත ඒකාබද්ධ කිරීමට අධික තදබදය විශාල තර්ජනයක් වී ඇත.

මෙම තත්ත්වයට ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අවධානය ඉක්මනින් ලැබිය යුතු බව පැහැදිලිය. මේ බන්ධනාගාර තදබදය මූලික මානව ගරුත්වය උල්ලංඝනය කිරීමට පමණක් නොව, ශ්‍රී ලංකාවේ යුක්තිය ඉටුකිරීමෙහි යාන්ත්‍රණයද දුර්වල කරනු ඇත.

COMMITTEE FOR PROTECTING RIGHTS OF PRISONERS

# බන්ධනාගාරවල අධික තදබදය




බන්ධනාගාර ධාරිතාව නොවෙනස්ව පවතින අතර, රැඳවියන්ගේ ජනගහනය සැලකිය යුතු ලෙස වර්ධනය වීම හරහා තදබදයක් ඇති වී තිබේ. 2015 දී 153% ක් වූ තදබදය 2024 දී 286.6% ක උපරිමයකට ළඟා වූ අතර එය දශකයේ ඉහළම අගයයි. 2020-2021 COVID කාලය තුළ තදබදයේ තාවකාලික පහත වැටීමක් තිබිණි.

**29,789**

දෛනික සාමාන්‍ය බන්ධනාගාර රැඳවියන් ගණන

**10,395**

දෛනිකව රැඳවීමට ඉඩ පහසුකම් ඇති ප්‍රමාණය

**286.6%**

දක්වා ධාරිතාවය ඉහළ ගොස් ඇත

(3 ගුණයකට ආසන්න ප්‍රමාණයකින්.

ඇතැම් බන්ධනාගාර වල මෙය 300 සිට 400%+ දක්වා පමන වේ)

**65%**

දෛනිකව රඳවා සිටින රැඳවියන්ගෙන් වරදකරුවන් නොවූ සංඛ්‍යාව

දෛනිකව රඳවා සිටින රැඳවියන්ගෙන් 65% ක් වරදකරුවන් නොවූ රැඳවියන්ය (19 479). බොහෝ දෙනෙක් දීර්ඝ කාලයක් බන්ධනාගාර ගතව සිටිති 2024 දෙසැම්බර් 31 වන විට මාස 1 සිට 6 දක්වා බන්ධනාගාර ගතව සිටින පිරිස 31% කි



**10,310**

දෛනික වරදකරුවන්

සෑම දිනකම වරදකරුවන් වූ පිරිමින් 9795 ක් සිරගත කරනු ලබන අතර වරදකරුවන් වූ කාන්තාවන් 515 ක් සිරගත කරනු ලැබේ. සිරගත කරන ලද සෑම වරදකරුවන් වූ පිරිමින් 19 දෙනෙකු සඳහාම දළ වශයෙන් වරදකරුවන් වූ කාන්තාවක් එක් අයෙකු සිරගත වනු ලබයි



**19,479**

දෛනික වරදකරු නොවූ පිරිස

සෑම දිනකම වරදකරු නොවූ පිරිමින් 8 423 ක් සිරගත කරනු ලබන අතර වරදකරු නොවූ කාන්තාවන් 1 056 ක් සිරගත කරනු ලැබේ. සිරගත කරන ලද සෑම වරදකරු නොවූ පිරිමින් 8 දෙනෙකු සඳහාම දළ වශයෙන් වරදකරු නොවූ කාන්තාවක් එක් අයෙකු සිරගත කරනු ලබයි

## මෙය වැදගත් වන්නේ ඇයි?

දැඩි තදබදය පුනරුත්ථාපනය අඩාල කරයි. සෞඛ්‍ය අවදානම් (මානසික සෞඛ්‍යය සහ රෝග සම්ප්‍රේෂණය ඇතුළුව) වැඩි කරයි. මත්ද්‍රව්‍ය වැරදි සිරගත වීම් වලදී ප්‍රධාන සාධකය වන අතර, සිරගත කිරීම සඳහා විකල්ප, පුළුල් වැඩසටහන් සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය මෙමගින් ඉස්මතු කරයි.

*Sources : CPRP Research Desk*

*Fact Sheet 01*